# උත්ථාන සමයේ සයවන සතිය
# සෙනසුරාදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයෙකි.

ක්‍රියා 18: 23–28

**"ජේසුස් ස්වාමින් වහන්සේ ක්‍රිස්තු තුමන් බවට අපොල්ලොස් වාද කළේය."**

පාවුලු අන්තියෝකියේ කලක් ගත කළ පසු පිටත්ව ගලාතිය සහ පිරිගිය යන පළාත් මැදින් යමින් සියලු ගෝලයන් ධෛර්යයවත් කළේය.

අලෙක්සන්ද්‍රියාවෙහි උපන් අපොල්ලොස් නම් එක්තරා ජුදෙව්වරයෙක් එපීසයට ආවේය. ඔහු ව්‍යක්ත කථිකයෙකි. බහුශ්‍රැත ධර්ම දේශකයෙකි. මේ මිනිසා ස්වාමින් වහන්සේගේ මාර්ගය ගැන ඉගෙනීම ලැබූවෙකි. ඔහු ජ්වලිත සිතින් දෙවියන් වහන්සේ පිළිබඳ කරුණු හරි ලෙස උගන්වමින් දේශනා කළේය. එහෙත් ඔහු දැනගෙන සිටියේ ජුවාම්ගේ බෞතීස්ම ස්නාපනය පමණකි. ඔහු ධර්ම ශාලාවෙහි දී නිර්භීතව කතාකරන්නට පටන් ගත්තේය. ප්‍රිස්කිලා ද අකිලා ද ඔහුගේ බස් අසා ඔහු තමන් ළඟට කැඳවා ගෙන දෙවියන් වහන්සේගේ මාර්ගය වඩා හරි ලෙස ඔහුට පහදා දුන්හ. තවද ඔහු ග්‍රීසියට යන්නට අදහස් කළ කල්හි සහෝදරයෝ ඔහු ධෛර්යවත් කොට ඔහු පිළිගන්නා ලෙස ගෝලයන්ට ලියා යැව්වේය. ඔහු එහි පැමිණි කල දේව වරප්‍රසාදය කරණකොටගෙන අදහාගෙන සිටි අයට බොහෝ උපකාර කළේය. මන්ද, ඔහු ජේසුස් වහන්සේ ක්‍රිස්තුස් බව ශුද්ධ

ලියවිල්ලෙන් පෙන්වා දෙමින් ජුදෙව්වරුන්ගේ තර්ක ප්‍රසිද්ධියේම එඩිතර ලෙස බිඳ හරිමින් පරාජය කළේය.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 47:1-3, 8-9

පිළිතුර: දෙවිඳාණෝ ජාතීන් අතර රජිඳාණෝය.

ගීය:

සව් සතුනි, අත්පොළොසන් දෙන්න. ජය ගොස නංවා දෙවිඳුන්ට තුති දෙන්න. අති උතුම් සමිඳාණෝ බියකරුය. මුළු මහ පොළොව කෙරේ අග රජ ය.

එතුමාණෝ ජාතීන් පරදා අපට ජය දුන් සේක. සව් සත කෙරේ අග රජ වන සේක. දෙවිඳාණෝ ජාතීන් අතර රජිඳාණෝ ය. එතුමාණෝ සුවිශුද්ධ සිහසුන් අරා වැඩ සිටින සේක.

ජාතීන්ගේ අධිපතීහු ආබ්‍රහම්ගේ වංශයට අයත් දේව සෙනඟ සමඟ එක්රුස් වන්නෝය. පොළොවේ බලවත් ජාතීහු දෙවිතුමන්ට අයිතිය. එතුමාණෝ උන් හැම කෙරේ රජකම් කරන සේක.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
"මම පියාණන් වහන්සේගෙන් අයදින්නෙමි.
උන්වහන්සේ ද ඔබ සමඟ යුගාන්තය දක්වා සදහටම සිටින පිණිස
වෙන සහායදායකයකු දෙන සේක."
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක ජුවාම්තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 16 : 23–28

**"ඔබ මට ප්‍රේම කරන බැවින් පියාණන් වහන්සේ ඔබට ප්‍රේම කරන සේක."**

"ඒ දවසේ දී ඔබ කිසි ප්‍රශ්නයක් මාගෙන් අසන්නේ නැත. ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. මාගේ නාමයෙන් ඔබ පියාණන් වහන්සේගෙන් යමක් ඉල්ලුවොත් උන්වහන්සේ ඒ දේ ඔබට දෙන සේක. මේ වනතෙක් ඔබ මාගේ නාමයෙන් කිසිවක් ඉල්ලා නැත. ඉල්ලන්න, ඔබට ලැබේ. මෙසේ ඔබගේ ප්‍රීතිය පූර්ණ වන්නේය."

"මේ දේවල් උපමා මගින් මම ඔබට කීවෙමි. එහෙත් තවත් උපමා මගින් කතා නොකර, පියාණන් වහන්සේ ගැන පැහැදිලි ලෙස ඔබට ප්‍රකාශ කරන කාලය පැමිණෙන්නේය. ඒ දවසේ දී ඔබ මාගේ නාමයෙන් අයදින්නහු ය. ඔබ උදෙසා පියාණන් වහන්සේට යාච්ඤා කරන්නෙමි යි මම නොකියමි. ඔබ මට ප්‍රේම කරන බැවින් ද මා පියාණන් වහන්සේ

වෙතින් වැඩම කළ බව ඔබ විශ්වාස කරන බැවින් ද පියාණන් වහන්සේම ඔබට ප්‍රේම කරන සේක. මම පියාණන් කෙරෙන් නික්ම ආවෙමි. ලෝකයට පැමිණ සිටිමි. මම නැවත ලෝකය අත්හැර පියාණන් වහන්සේ වෙතට යන්නෙමි” යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.